**ශීර්ෂය 139 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2013 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

**ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| **ශීර්ෂය** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,774,206,239 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.2,268,336,725 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.206,999,474 ක් හා රු.298,870,040 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 9.84 ක් හා සියයට 44.57 ක් වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 139 | 2,103,676,239 | 1,896,676,765 | 206,999,474 | 9.84 |
| 290 | 670,530,000 | 371,659,960 | 298,870,040 | 44.57 |
| **එකතුව** | **2,774,206,239** | **2,268,336,725** | **505,869,514** | **18.23** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් එකතුව රු.70,410,597 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රතිපාදන ලබා ගත් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ලද ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | ලද ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | රු. | |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 14,334,500 | 11,573,150 | 2,761,350 | 19.26 |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් ලේකම්, කළුතර | 270,000 | 242,999 | 27,001 | 10.00 |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් ලේකම්, කොළඹ | 97,833 | 97,833 | - | - |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් ලේකම්, ගම්පහ | 527,667 | 527,667 | - | - |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 7,703,685 | 7,703,685 | - | - |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 47,476,912 | 47,367,254 | 109,658 | 0.23 |
| **එකතුව** | | **70,410,597** | **67,512,588** | **2,898,009** | **4.11** |

**2.2 ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සඳහා ආදායම් සංකේත 01 ක් සඳහා එකතුව රු.මිලියන 10.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 10.84 ක ආදායමක් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රු.838,496 ක් හෙවත් සියයට 8.38 ක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම** | |
| | රු. | රු. | රු. | |
| 10.03.07.06 | 10,000,000 | 10,838,496 | 838,496 | 8.38 |

**2.3 අත්තිකාරම් ගිණුම්**

**2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 13901 | 6,300,000 | 4,161,677 | 3,800,000 | 4,918,169 | 38,000,000 | 23,730,366 |
| 29001 | 20,000,000 | 15,475,399 | 12,000,000 | 17,916,239 | 112,000,000 | 67,780,614 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.4.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු. 47,641,347 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 7002/0000/000/0089/0013/000 | 47,637,759 |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 7002/0000/000/0257/0013/000 | 3,588 |
| **එකතුව** | | **47,641,347** |

### 2.4.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 43,582,353 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/000/0015/0051/000 | 39,179,041 |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0145/000 | 4,403,312 |
| **එකතුව** | | **43,582,353** |

## 2 කොටස

----------

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

---------------------------------------------------

**1. ශීර්ෂය 139 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

---------------------------------------------------------------

**1.1 විගණන විෂය පථය**

----------------------

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 13 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සෙයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා

වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.110,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26 සිට සියයට 96 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) මව් යාත්‍රා මිලට ගැනීමට සමාලෝචිත වර්ෂය සඳහා රුපියල් මිලියන 110 ක ප්‍රතිපාදන සළසා තිබුණත් එම ප්‍රතිපාදන උපයෝගි කරගෙන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයට පර්යේෂණ නෞකාවක් සඳහා රුපියල් මිලියන 30 ක් ද, දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 80 ක් වශයෙන් මුළු ප්‍රතිපාදන වෙනත් කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණි.

2006 වර්ෂයේ සිට සෑම වර්ෂයකම මව් යාත්‍රා මිලට ගැනිම සඳහා අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන සළසාගෙන එම ප්‍රතිපාදන වෙනත් කාර්යයන් සඳහා මාරුකිරීම දිගින් දිගටම සිදුකර තිබූ අතර 2013 දෙසැම්බර් 31 දින වන විටත් යාත්‍රා මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) විදේශ ගමන් වැය විෂයය සඳහා වූ රු.4,500,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 මගින් රු.4,697,715 ක් ද, පරිපූරක ඇස්තමේන්තු මගින් රු.1,500,000 ක්ද ප්‍රතිපාදන සළසාගෙන තිබුණි. මෙලෙස අතිරේකව ලබාගෙන තිබූ ප්‍රතිපාදන මුල් ප්‍රතිපාදනයෙන් සියයට 138 ක් වී තිබුණි.

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

---

දිවිනැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් එකතුව රු.14,334,500 ක් වූ ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ලබා දි තිබුණු අතර එම ප්‍රතිපාදනයෙන් රු.11,573,150 ක් උපයෝජනය කර තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිවි නැගුම ධීවර අංශයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් 2012 වර්ෂයේදී රු.23,832,000 ක් ලැබී තිබුණි. ඌන කාර්යසාධනය හේතුවෙන් එම ප්‍රතිපාදන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ආපසු ලබාගෙන තිබුණු අතර 2013 වර්ෂයේදී ලැබී තිබුණු රු.7,669,565 ක ප්‍රතිපාදනයෙන් 2012 වර්ෂයේ ආරම්භ කළ ව්‍යාපෘති සඳහා වැයකර තිබුණි. 2012 වර්ෂයට අදාළව ව්‍යාපෘති සඳහා ලබා දී තිබුණු අත්තිකාරම්වලින් රු.5,940,164 ක් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 139 ශීර්ෂය මඟින්ද, රු.1,729,401 ක් දිවිනැගුම 2013 වැඩසටහන මඟින්ද පියවා තිබුණි. අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී විධිමත් ඇස්තමේන්තු පිළියෙළ කිරීමක් හෝ වියදම් කළමනාකරණයක් නොතිබීමෙන් 2013 දිවි නැගුම ව්‍යාපෘතියේ යෝජිත ඉලක්ක කරා ලඟා වී නොතිබූ බවත් නිරීක්ෂණය විය.

(ii) දිවිනැගුම 2013 වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රතිලාභීන්ට මූල්‍යාධාර වාරික ගෙවීමට ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත රු.45,000,000 ක අත්තිකාරම් ලබාදී තිබුණි. එයින් රු.6,645,950 ක් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල වියදම් පියවා ගැනිම සඳහා යොදා ගෙන තිබුණි.

(iii) ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් දිවි නැගුම වැඩසටහන සඳහා ලබා ගන්නා ලද අත්තිකාරම් පියවීම සඳහා ඉදිරිපත් කර තිබුණු රු.1,809,000 ක් වූ වවුචර්පත් 3 ක් උපයෝගී කරගෙන අමාත්‍යාංශය විසින් අත්තිකාරම් දෙවරක් පියවා තිබුණි. මේ හේතුවෙන් රු.1,062,000 ක අත්තිකාරම් සාවද්‍ය ලෙස වැඩිපුර පියවා තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

**--------------**

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0008/0013/000 දරන අග්‍රිම ගිණුමේ රු.47,637,759 ක ශේෂය පියවා නොතිබුණි. අමාත්‍යාංශය විසින් ලංකා ධීවර සංස්ථාවට මසුන් මිලට ගැනීම සඳහා සහ වෙනත් දෛනික වියදම් සඳහා ආපසු ලබාදීමේ එකඟතාව මත 2010 නොවැම්බර් 05 දින ලබාදී තිබුණු රු.10,000,000 ක අත්තිකාරම් සඳහා වසර 03 ක් කාලයක් ඉකුත් වී තිබුණද, එම අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

--------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 13901 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 1,468,522 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 1987 සිට 1994 දක්වා කාලයක සිට පැවත එන ස්ථාන මාරු වී ගිය නිළධාරීන් 14 දෙනෙකුගෙන් අය විය යුතු රු.153,526 ක ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 වගන්තිය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කර අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(iii) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් අතුරින්, විවිධ හේතු මත නිරවුල් නොවී පවතින නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.45,910 ක ණය ශේෂ ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන ලෙස 2006 දෙසැම්බර් 28 දිනැති අංක 1/7/19/විශේෂ කමිටු දරන අත්තිකාරම් නිරවුල් කිරීමේ කමිටු සභාපතිගේ ලිපිය මඟින් දන්වා තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.8 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුව කටයුතු නොකර, රාජ්‍ය සංස්ථා, ආයතන හා ව්‍යාපෘතිවලට මුදාහල නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.329,987 ක ණය ශේෂ අයකර ගැනිමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(v) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.1 හා 4.2 වගන්ති ප්‍රකාරව කටයුතු නොකිරිම නිසා 1985 වර්ෂයේ සිට 1991 වර්ෂය දක්වා කාලය තුළ විශ්‍රාම ගිය නිලධාරීන් 35 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.127,580 ක ණය ශේෂ අය නොවී පැවතුණි.

(vi) 1986 වර්ෂයේ සිට 1995 වර්ෂය දක්වා කාලය තුළ මිය ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අය විය යුතු රු.62,569 ක ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.4 වගන්තිය ප්‍රකාර කටයුතු කර අයකර ගෙන නොතිබුණි.

(vii) 1994 ඔක්තෝබර් 01 දින සිට වැඩ තහනමකට ලක්ව සිටින රියදුරෙකුගෙන් අය විය යුතු ණය වාරික 2013 ඔක්තෝබර් මාසයෙන් පසු අයකර ගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම හිඟහිටි ණය ශේෂය රු.14,000 ක් විය.

(viii) වර්ෂ 1985 සිට 2009 අප්‍රේල් 01 දින දක්වා කාලය තුළ සේවය හැර ගිය නිලධාරීන් 24 දෙනෙකුගෙන් අය විය යුතු රු.665,471 ක ණය ශේෂ වර්ෂ ගණනාවක් මුළුල්ලේ හිඟහිටව පැවැත එමින් තිබුණි. ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.4.1 සහ 4.5 වගන්තිවලට අනුව අදාළ ඇපකරුවන්ගෙන් එම ණයශේෂ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ix) 1994 හා 1995 වර්ෂවල හිටපු අමාත්‍යවරයෙකුගේ නිල කාලය අවසන් වීමත් සමඟ අමාත්‍ය මණ්ඩල තීරණයක් මත සේවය අවසන් කර තිබූ පුද්ගලික ආරක්ෂක නිළධාරීන් 04 දෙනෙකුගෙන් අය විය යුතු රු.78,754 ක ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.1 වගන්තිය අනුව කටයුතු කර අයකර ගෙන නොතිබුණි.

**1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය සඳහා කළමනාකරණය වෙත නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

-----------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු ඌනතාවයන් 46 ක් හා අතිරික්තතා 5 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 752(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) අමාත්‍ය නිල නිවසේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අසම්පූර්ණ වන අතර එහි තථ්‍ය ශේෂය දක්වා නොතිබුණි.

(iii) නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

### (ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

--------------------------------------------

අමාත්‍යාංශය විසින් මෝටර් රථයක් ජලජීවී වගා සංවර්ධන අධිකාරියට සහ තවත් මෝටර් රථයක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත අවිධිමත් ලෙස මුදාහැර තිබුණු බව නිරීක්ෂණය විය.

### (ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

--------------------------------------------------------------------

වෙනත් ආයතන සතුව තිබුණු සමහර වත්කම් විධිමත් අනුමැතියකින් තොරව භාවිතයට ගෙන තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතනය | සංඛ්‍යාව |
|---|---|---|
| මෝටර් වාහන | ලංකා ධීවර සංස්ථාව | 01 |
| | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 01 |
| | ආහාර හා කෘෂිකර්ම සංවිධානය | 02 |

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

**----------------------------**

අමාත්‍යාංශයේ හා ඊට අනුබද්ධිත ආයතනවල 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.279,420,369 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 214 හි සඳහන් අවශ්‍යතා ඉටුවන පරිදි බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 94(1) සඳහන් විධිවිධානවලට අනුකූල නොවී වැය විෂයයන් 10 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරි ප්‍රතිපාදනය ඉක්මවා එකතුව රු.219,430,504 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 1.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

**-----------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 1.6.1 නිමකළ විදේශාධාර ව්‍යාපෘති වලින් අරමුණු සාක්ෂාත් කරගැනිම හා ඒවායේ වත්කම් පැවරීම පිළිබඳ වාර්තා ඉදිරිපත් නොකිරිම.

**------------------------------------------------------------------------------------------------------**

නිමකර තිබූ පහත සඳහන් විදේශාධාර ව්‍යාපෘතිවලින් අපේක්ෂා කළ අරමුණු සාක්ෂාත් කර ගැනිම හා ව්‍යාපෘති සඳහා මිලදී ගෙන තිබුණු වත්කම් පැවරීම පිළිබඳ වාර්තා 2013 දෙසැම්බර් 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය නිමකළ දිනය |
|---|---|
| ---------- | ---------------- |
| සුනාමියෙන් විපතට පත් වූ ප්‍රදේශ යළි ගොඩ නැඟීමේ ව්‍යාපෘතිය | 2010.12.31 |
| වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය | 2009.06.30 |
| පශ්චාත් සුනාමි ජීවනෝපාය සහාය සහයෝගීතා වැඩසටහන | 2011.09.30 |
| ශ්‍රී ලංකා මහාද්වීපික තටකයේ බාහිර සීමාව නිර්ණය කිරීමේ ව්‍යාපෘතිය | 2012.12.31 |

**1.6.2 දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතිය**

**-----------------------------------**

දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) ව්‍යාපෘති අරමුණු වලට පටහැනි වියදම්**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘති අරමුණුවලට පටහැනිව රු.1,737,000 ක් කසල ඉවත් කිරීමට වත්තල ප්‍රාදේශීය සභාවට ගෙවා තිබුණි.

(ii) අරමුණු වලට පටහැනිව ව්‍යාපෘති අරමුදලින් රු.මිලියන 33 ක් රාජ්‍ය සමාගමක් වූ පදනමකට එහි මූල්‍ය දුෂ්කරතා පියවා ගැනීම පිණිස අත්තිකාරමක් ලෙස 2012 වර්ෂයේ ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම අත්තිකාරම්වලින් රු.29,641,352 ක් නොපියවා තිබුණි.

**(ආ) ව්‍යාපෘතිය මඟින් සිදුකළ මිලදී ගැනීම්**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු උපරිම ආර්ථිකභාවයෙන් යුතුව හා අවම පිරිවැයක් යටතේ සිදුකළ යුතු වුවත්, ව්‍යාපෘතිය සඳහා උපකරණ කට්ටල මිලදී ගැනීමේදී රාජ්‍ය සමාගමක මැදිහත්වීම මඟින් රු.32,449,064 කට මිලදී ගෙන තිබුණු අතර, එම වටිනාකමෙන් රු.1,655,504 ක ආන්තිකයක් එම රාජ්‍ය සමාගමට ලැබෙන පරිදි ගනුදෙනු සිදුකර තිබුණි. ඒ අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව හා විධිමත් අධිකාරි බලයක් රහිතව රු.1,655,504 ක් අමතරව ගෙවා තිබුණි.

(ii) ධීවර වරාය ඉදිකිරීම සඳහා ලද ප්‍රතිපාදනවලින් ධීවර වරායේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 5 ක් වෙන් කර ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ අවශ්‍යතා මත භාණ්ඩ මිලදී ගෙන තිබුණි. මෙම මිලදී ගැනීමේදී ආර්ථිකභාවයකින් යුතුව කටයුතු කර නොතිබූ බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

- මුදල් සේප්පුවක් තිබියදී තවත් සේප්පුවක් රු.68,628 කට මිලදී ගැනීම.

- පරිගණක හා උපාංග 15 ක් මිලදී ගෙන තිබියදී නැවතත් පරිගණක 3 ක් රු.230,670 කට මිලදී ගැනීම.
- වටිනාකම රු.188,809 කට IP Phone 10 ක් මිලදී ගැනීම.
- ඡායා පිටපත් යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබියදී තවත් ඡායාපිටපත් යන්ත්‍රයක් රු.94,080 කට මිලදී ගැනීම.
- ෆැක්ස් යන්ත්‍ර 04 ක් රු. 66,080 කට මිලදී ගැනීම.
- ලිපිගොනු කබඩ් 23 ක් රු.340,388 කට මිලදී ගැනීම.
- පරිගණක මුද්‍රිත යන්ත්‍ර 07 ක් රු.330,780 කට මිලදී ගැනීම.

(iii) ව්‍යාපෘතිය අවසන් වීමට මාස 06 ක් පමණ තිබියදී රු.829,574 ක් වැය කර ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. එම භාණ්ඩ හා උපකරණ භාවිතා කිරීමට තිබු කාලය සළකා බැලීමේදී ඵලදායී ලෙස ව්‍යාපෘති අරමුණට භාවිතා කරන ලද වත්කම් බවට සෑහීමට පත්විය නොහැකි විය.

**(ඇ) අයිස් නිෂ්පාදනාගාරය**

**----------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ධීවර වරාය ව්‍යාපෘතියේ 3 වන පියවර යටතේ රු.97,149,878 ක් වැය කර ඉදිකර තිබූ අයිස් නිෂ්පාදනාගාර ගොඩනැගිල්ලේ එක් යන්ත්‍රාගාරයක් 2014 ඔක්තෝබර් 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

(ii) ධීවර වරායේ අයිස් සැකසුම් අංශයේ සවිකර තිබූ රු.1,752,920 ක් වටිනා Hoist & Over Head Crane යන්ත්‍රය අක්‍රීයව තිබූ බැවින්, අයිස් නිෂ්පාදනාගාරය බදුගත් ආයතනය විසින් නව යන්ත්‍රයක් මිලදී ගෙන සවිකර මෙහෙයුම් කටයුතු පවත්වා තිබූ අතර මේ සඳහා රු.580,483 ක් ව්‍යාපෘතිය මඟින් ගෙවා තිබුණි. මෙහිදී යන්ත්‍රයේ අයිතිය පිළිබඳව එකඟතාවයකට එළඹ නොතිබූ බැවින් ධීවර වරායට මෙන්ම බදුකරුටද අදාල යන්ත්‍රයේ අයිතියට හිමිකාරීත්වයක් තිබීමෙන් ඉදිරියේදී ගැටලුකාරී තත්ත්වයක් ඇතිවීමේ අවදානමක් පැවැතුණි.

(iii) කොන්ත්‍රාත්කරුගේ වගකීම් කාලයෙන් ආවරණය වන අයිස් සැකසුම් අංශයේ කාමරවල සිදු කළ යුතු අලුත්වැඩියා අයිස් නිෂ්පාදනාගාරය බදුගත් ආයතනය විසින් සිදු කරගෙන තිබූ නමුත් ඒ සඳහා රු.1,557,628 ක් අයිස් නිෂ්පාදනාගාරය බදුගත් ආයතනයට ව්‍යාපෘතියෙන් ගෙවා තිබුණි.

(iv) එකතුව රු.598,000 ක් වටිනා "Ice Crusher" යන්ත්‍ර 02 ක් වසර 02ක පමණ කාලයක් මුළුල්ලේ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

**(ඇ) නොපියවූ අත්තිකාරම්**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බෝට්ටු යාත්‍රාංගනය ඉදිකිරීම සඳහා සී/ස සීනෝර් පදනමට ලබා දී තිබූ අත්තිකාරම්වලින් රු.868,460 ක් අඩුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ දක්වා තිබුණි.

(ii) ධීවර වරාය නීතිගත සංස්ථාවට ලබා දී තිබූ රු.2,978,060 අත්තිකාරම් පියවා තිබූ නමුත් පියවීම් වවුචර් ඉදිරිපත් නොකර ජර්නල් සටහන් මඟින් පියවා තිබුණි.

**(ඉ) කාර්ය මණ්ඩල ගෙවීම්**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 4.2.2 ඡේදය ප්‍රකාරව ව්‍යාපෘති කාර්ය මණ්ඩලය, අදාළ වැටුප් පියවරවල මුල් පියවරේ පිහිටුවිය යුතු අතර, එම චක්‍රලේඛයේ 9:1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන ඇගයීමකට ලක් කිරීමෙන් පසු ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට වැටුප් වර්ධක ගෙවිය යුතු වුවත්, එවැනි කාර්යසාධන ඇගයීමක් සිදු නොකර 2011 ජූනි මාසයේ සිට 2013 දෙසැම්බර් මාසය දක්වා වැටුප් වර්ධක වශයෙන් රු.287,166 ක් කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි.

(ii) අර්ධ කාලීන පදනම මත සේවයේ නියුතු ව්‍යාපෘති අධ්‍යක්ෂගේ ජීවන වියදම් දීමනාව ස්ථිර සේවා ස්ථානයෙන් ලබාගත යුතු වුවත්, 2011 ජූනි මාසයේ සිට 2013 දෙසැම්බර් මාසය දක්වා රු. 252,500 ක් ව්‍යාපෘතිය මඟින් ගෙවා තිබුණි.

**(ඊ) වාහන අනතුරු**

----------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අනතුරට පත්ව තිබූ කැබ්රථයක් රු.939,173 ක් ගෙවා වාහනයේ නියෝජිත ආයතනයෙන් අලුත්වැඩියාව සිදු කර ගෙන තිබුණි. එම අලාභය ආවරණය කර

ගැනීම සඳහා රක්ෂණ සමාගමෙන් ඉල්ලීම් කර තිබුණද, රක්ෂණ සමාගම විසින් එම අලාභය ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් අනියම් පදනම මත සේවයේ යොදවා ගෙන තිබුණු රියදුරෙකු වගකිව යුතුව තිබුණත් ඔහු රියදුරු සේවයෙන් ඉවත් වී තිබුණි. කෙසේ වුවත්, මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර අලාභහානියට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ii) කැබ් රථය අනතුරට භාජනය වීම නිසා එහි අලුත්වැඩියා කටයුතු නිමවන තෙක් 2013 ජූලි 26 දින සිට ඔක්තෝබර් මාසය දක්වා මසකට රු.63,000 බැගින් වූ කුලී ගෙවීමේ පදනම මත පෙට්‍රල් මෝටර් රථයක් ලබාගෙන තිබුණද, ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## (උ) වරාය විවෘත කිරීමේ උත්සවයට අදාල ගෙවීම්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) දික්ඕවිට ධීවර වරාය විවෘත කිරීමේ උත්සවයේ සැරසිලි කටයුතු ඉටුකළ පුද්ගලික ආයතනයට කළ ගෙවීම් සම්බන්ධව පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් මිල ගණන් විමසීමකින් තොරව උත්සවයේ සැරසිලි කටයුතු කිරීම වෙනුවෙන් ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ආවරණ අනුමැතියක් ලබා දී තිබුණි. එම අනුමැතිය පදනම් කරගෙන ඒ පිළිබඳ කිසිදු විමසීමක් සිදු නොකර අනුමත හා එකඟ වූ මුදල ඉක්මවා රු.1,898,950 ක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි.
- උත්සවය සඳහා අතිවිශේෂ හා විශේෂ අමුත්තන්ගේ පුටු 545 ක් හා උත්සව ශාලා සාමාන්‍ය පුටු 4,750 ක් සැපයූ බව දක්වමින් අදාල ආයතනයට මුදල් ගෙවා තිබුණද, වේදිකා සැලැස්ම අනුව පැනවිය හැකි පුටු සංඛ්‍යාව පිළිවෙලින් පුටු 260 ක් හා 1,800 ක් බව අනාවරණය විය. ඒ අනුව පුටු සඳහා රු.300,250 ක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

- උත්සවය සඳහා පුවත්පත් දෙකක දැන්වීම් පල කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු.19,800 ක් හා රු.140,800 ක් වශයෙන් එකතුව රු.160,600 ක් එම පුවත්පත් ආයතන වෙත වැඩිපුර ගෙවා තිබුණි.

(ii) ශිලා ඵලකය වෙනුවෙන් අඩුම මිල ඉදිරිපත් කළ ආයතනයට කාර්ය පවරා තිබූ අතර ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාදීමේදී අමතර ගාස්තු වශයෙන් රු.350,000 ක් එම ආයතනයට ගෙවිය යුතු බව  සඳහන් කර කමිටුව විසින් මිල ගණන් අනුමත කර තිබුණි. එම අමතර ගෙවීම පිළිබඳ විස්තර සඳහන් කර නොතිබුණි.

(iii) ධීවර වරායේ තොරතුරු ඇතුළත් පොත් 7,500 ක් වෙනුවෙන් රු.470,000 ක්ද, මාර්ග පෝස්ටර් 100,000 ක් මුද්‍රණය වෙනුවෙන් රු.1,500,000 ක්ද, තොරණ 4 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.1,160,000 ක් හා සමරු ඵලකය වෙනුවෙන් රු.1,000,000 ක්ද ගෙවා තිබුණ අතර අදාල කාර්යයන් ඉටුකරන ලද බවට වූ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත්  කර නොතිබුණි.

**(ඍ) දික්ඕවිට වරායේ පිවිසුම් මාර්ගය හා පාලම ඉදිකිරීම**

**-----------------------------------------------------------**

ව්‍යාපෘතිය යටතේ වරාය පිවිසුම් මාර්ගය හා පාලම ඉදිකිරීම සඳහා නෙදර්ලන්ත රාජ්‍ය ආධාර (ORET)  වශයෙන් යුරෝ 800,000 ක් ප්‍රතිපාදන සළසා තිබුණද පිවිසුම් මාර්ගය සඳහා වූ පාලම පමණක් ඉදිකර තිබූ අතර එය ප්‍රධාන මාර්ගයට සම්බන්ධ කර නොතිබීම හේතුවෙන් පාලම භාවිතයට  ගැනිමට නොහැකි වි තිබුණි.

**(එ) ගිණුම්කරණය**

**---------------**

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් දික්ඕවිට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.19,643,222 ක ඍජු වියදම් ව්‍යාපෘතියේ 2013 මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය විසින් ඉදිකිරීම කොන්ත්‍රාත් ආයතනයකට හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව තිබූ පිළිවෙලින් රු.74,855,517 ක හා රු.30,000,000 ක බදු මුදල් අඩිවෙන් කිරීම් ලෙස ලියා හැර තිබුණද, ඊට අදාල අනුමැතීන් හා හේතු විගණනයට ඉදිරිපත්  කර නොතිබුණි.

(iii) ව්‍යාපෘතියේ රු.37,181,079 ක් වූ ලැබිය යුතු ශේෂ හා රු.83,223,550 ක් වූ ගෙවිය යුතු ශේෂ සඳහා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඒ) විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවීම**

දික්ඕවිට වරාය ව්‍යාපෘතිය විසින් සී/ස. සීනෝර් පදනම වෙත ප්‍රතිපූර්ණය කරන ලද රු.143,260 ක් වූ වියදම්වලට අදාල ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 1.7 කාර්යසාධනය

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍ය කාර්යාලය සඳහා රුපියල් මිලියන 6.75 ක් ද, අමාත්‍යාංශ පරිපාලනය වෙනුවෙන් රුපියල් මිලියන 51.7 ක් ද, වශයෙන් ප්‍රතිපාදනය සළසා තිබුණත්, එම අංශ සඳහා ක්‍රියාකාරි සැලැසුම් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ක්‍රියාකාරි සැලැස්මේ 2013 වර්ෂය සඳහා මානුෂිය සම්පත් ලබාගැනිම, යෙදවීම, හා සංවර්ධනය සඳහා වූ සැලැසුම් ඇතුළත් කර නොතිබුණි.

(iii) 2013 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැසුමේ ඇතුළත් එක් එක් කාර්ය සඳහා භෞතික කාර්යසාධන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු ප්‍රධාන කාර්යයන් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) ක්‍රියාකාරි සැලැසුම අනුව ධීවර ප්‍රජාවගේ උන්නතිය සඳහා සැලැසුම් කරන ලද ඉලක්කවලට පූර්ණ වශයෙන් ළඟාවීමට අපොහොසත් වීම නිසා ධීවර සමාජ සංවර්ධන කටයුතු සඳහා සළසා තිබුණු රුපියල් මිලියන 345 ක ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 180.18 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ii) උතුරු පළාතේ ධීවර ජනතාව ශක්තිමත් කිරිමේ වැඩසටහනෙන් සියයට 49 ක් පමණක් ක්‍රියාත්මක කර තිබු අතර එම වැඩසටහන නියමිත ඉලක්ක කරා ලඟා වීම දූර්වල තත්ත්වයක පැවතුණි.

(iii) ඉරණමඩු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරිමේ කටයුතු සඳහා සළසා දී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 20 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරිමෙන් අපේක්ෂිත මත්ස්‍ය නිෂ්පාදන ඉහළ නැංවීම හා එමගින් ග්‍රාමිය ආර්ථිකය හා පෝෂණ මට්ටම ඉහළ නැංවීමත්, උතුරු ප්‍රදේශයේ ජලාශවලට අවශ්‍ය මත්ස්‍ය බීජ සපයා තැන්පත් කිරිමේ අරමුණ කරා ලඟාවීමටත් සමාලෝචිත වර්ෂයේදී අපොහොසත් වී තිබුණි.

(iv) මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට මිරිදිය ජලාශ තුළ නොමිලේ මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරිමේ ව්‍යාපෘතියේ කාර්යසාධනය සියයට 30 ක් පමණක් වී තිබුණි. ඒ අනුව කරදිය මත්ස්‍යයින් පරිභෝජනය කිරිමට අපහසු ග්‍රාමීය ජනතාව හා වතු ආශ්‍රිත ජනතාව සඳහා සත්ව ප්‍රෝටීන ලබාදෙන විකල්ප ප්‍රභවයක් වශයෙන්ද, ග්‍රාමීය ප්‍රජාවගේ ජීවනෝපාය සපයන මාර්ගයක් ලෙස හා අපනයන වෙළඳපලක් ඇති නිෂ්පාදන මඟින් රටේ අපනයන ආදායම සඳහා දායකත්වය වැඩිකිරිම යන ඉලක්ක කරා ලඟාවීම දුෂ්කර වී තිබුණි.

**(ඈ) කාර්යසාධනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවීම**

ප්‍රසම්පාදන සැලැස්මට අනුව රුපියල් මිලියන 265.5 ක ධීවර ආම්පන්න මිලදී ගැනිම සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණද, ඒ සම්බන්ධයෙන් වූ සත්‍ය කාර්යසාධනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 1.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක මු.ක්‍ර.අ. 01/2010/01 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 2(1) ඡේදය සහ 2012 ජූනි 11 දිනැති අංක 1/1/16 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයෙහි 3 ඡේදය හා 04 ඡේදයට පටහැනිව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකු 2012

නොවැම්බර් 01 දින සිට 04 දින දක්වා පෞද්ගලික චීන සංචාරයක යෙදී තිබුණි. අනතුරුව 2012 නොවැම්බර් 05 දින සිට 08 දින දක්වා දින 04 ක් රාජකාරී කටයුතුවල යෙදුණු බව සඳහන් කර තිබූ අතර, අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව ඉටුකළ එම රාජකාරී වෙනුවෙන් දින 04 ක් සඳහා සංයුක්ත දීමනා හා අනියම් දීමනා වශයෙන් රු.241,351 ක් ගෙවා තිබුණි. එමෙන්ම එම නිලධාරියා අදාල රාජකාරියේ යෙදුනු බව තහවුරු කළ හැකි සාක්ෂිද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ලංකා ධීවර සංස්ථාවේ සභාපතිගේ යුරෝපා සංචාරයක ගුවන් ගමන් බලපත්‍ර ගාස්තු ලෙස රු.152,000 ක් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් ගෙවා තිබුණි.

## 1.9 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

අමාත්‍යාංශ පරිශ්‍රය නවීකරණය කිරීම යටතේ සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් කාර්යයන් නිමකර තිබුණි.

| **කාර්යය** | **පිරිවැය** |
|---|---|
| | රු. |
| අමාත්‍යාංශ ගොඩනැගිල්ලට පිවිසෙන ප්‍රධාන දොරටුව ඉදිකිරීම | 506,198 |
| VIP ගරාජ 03 ක් ඉදිකිරීම | 448,668 |
| ආපනශාලාව ඉදිරිපිට කොන්ක්‍රීට් ගල් ඇතිරීම | 495,460 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා ඇස්තමේන්තු හා සැලැසුම් පිළියෙළ කර නොතිබූ අතර කොන්ත්‍රාත්තුව භාරදෙන ලද ආයතනයේ මිල ගණන් ඇස්තමේන්තු ලෙස සළකා සුළු ප්‍රසම්පාදන කමිටුව කාර්යයන් ඉටු කරවා ගැනීම අනුමත කර තිබුණි.

(ii) මෙම අනුමත කිරීමේදී ප්‍රසම්පාදන කමිටුව තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශ ලබාගෙන නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 හා 3.4 මාර්ගෝපදේශවලට පටහැනිව යථෝක්ත කාර්යයන් ඉටුකරවා ගෙන තිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 මාර්ගෝපදේශයට පටහැනිව ඉහත සඳහන් කාර්යයන් හදිසි ප්‍රසම්පාදන කටයුතු ලෙස සළකා කටයුතු කර තිබුණි.

(v) අමාත්‍යාංශ ගොඩනැගිල්ලට පිවිසෙන ප්‍රධාන දොරටුව ඉදිකිරීමේදී ගලවා ඉවත් කරන ලද පැරණි යකඩ දොරවල් 02 ක් විකිණීමේදී මුදල් රෙගුලාසි 770 සහ 772 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.10 පාඩු හා හානි

-------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) හානි පිළිබඳ ලේඛනය**

-------------------------

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු හානි පිළිබඳ ලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) වාහන අනතුරු වලින් සිදු වූ පාඩු**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 වර්ෂයේදී අමාත්‍යාංශයේ වාහන 12 ක් අනතුරුවලට භාජනය වී තිබූ අතර 2013 වර්ෂයේ විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ. 7 ආකෘතියේ පාඩු හා අත්හැරීම ප්‍රකාශයේ හෝ ඩී.ජී.එස්.ඒ. 7(1) පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශයේ එම අනතුරු පිළිබඳ විස්තර සඳහන් කර නොතිබුණි.

(ii) ඉහත සඳහන් අනතුරු 12 න් වාහන 03 කට අදාල එකතුව රු.135,280 ක් වූ රක්ෂණ මඟින් ආවරණය කර ගැනීමට නොහැකි වූ අලාභහානි අදාල වගකිව යුතු පුද්ගලයින්ගෙන් අයකර ගැනීම වෙනුවට පොත්වලින් කපා හැරීමට තීරණය කර තිබුණි.

**(iii)** වාහන අනතුරු හා වෙනත් කටයුතුවලදී අමාත්‍යාංශයට සිදුවී ඇති පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102 සිට 113 දක්වා වූ රෙගුලාසිවල දැක්වෙන ක්‍රියාමාර්ග ගැනීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

## 1.11 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 18 | 03 |
| (ii) තෘතියික මට්ටම | 05 | 01 | 04 |
| (iii) ද්විතියික මට්ටම | 124 | 77 | 47 |
| (iv) ප්‍රාථමික මට්ටම | 54 | 53 | 01 |
| (v) වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 07 | 07 | - |
| **එකතුව** | **211** | **156** | **55** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 55 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

### (ආ) වෙනත් දෙපාර්තමේන්තුවක් වෙත අවිධිමත් ලෙස සේවකයකු නිදහස් කිරීම

අමාත්‍යාංශය විසින් 2010 ජූලි 07 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලයක් සඳහා කාර්යාල කාර්ය සහායකයෙක් අවිධිමත් ලෙස ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට නිදහස් කර තිබුණි.

## 2. ශීර්ෂය 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

---

### 2.1 විගණන විෂය පථය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 11 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

**-------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එක් වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.277,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය වෙනත් වැය විෂයන්ට මාරුකර තිබූ අතර එසේ මාරුකළ ප්‍රමාණය ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 70 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) පුනරාවර්තන වැය විෂයන් 07 ක් හා මුලධන වැය විෂයන් 05 ක් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයන්ගෙන් ප්‍රතිපාදන මාරු කරගෙන තිබූ අතර මාරු කර තිබුණු ප්‍රතිපාදනය මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 300 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iv) මුදල් රෙගුලාසි 50(1) ට අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරිමේදි පූර්ව අනුමාන කළහැකි සියලුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුළත් කර ඇති බව සහ ඒවා මුදල් වර්ෂයේදී තම දෙපාර්තමේන්තුවට ඉටුකළ හැකි ශක්තිය ඇතුළත වන බවට ද ගණන්දීමේ නිලධාරියා වගබලා ගත යුතු වුවද, ඉන්ධන මිල වැඩිවීමෙන් බලපෑමට ලක්වූ ධීවරයන්ට සහන සැලසීම සඳහා 290-01-01-7-2502 වැය විෂය සඳහා රු.300,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම අරමුණු ඉටු කිරිම වෙනුවෙන් උපයෝජනය නොකර එම ප්‍රතිපාදනවලින් රු.23,000,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණු අතර රු.277,000,000 ක ප්‍රතිපාදන ඉතිරි කිරිම් ලෙස දක්වා තිබුණි.

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

**------------------------------------------------------------------------------------------**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු හතරක් විසින් එකතුව රු.55,676,097 ක් වූ ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.47,367,254 ක් හා රු.8,172,185 ක් වශයෙන් එකතුව රු.55,539,439 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය මගින් ලබාදුන් ප්‍රතිපාදන රු.109,658 ක්ද දෙපාර්තමේන්තුවක් මගින් ලබා දුන් ප්‍රතිපාදන රු.27,000 ක්ද අදාල කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**
**-------------------------**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.1,128,990 ක්වූ තැන්පතු 12 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඈ) ආදායම් ගිණුම්**
**------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ස්වස්ථතා සහතික නිකුත් කිරිමේ බලපත්‍ර සඳහා ඇස්තමේන්තුගත ආදායම රු.5,200,000 ක් වූ අතර රැස්කළ ආදායම රු.4,202,000 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමට වඩා රු.998,000 ක් අඩුවෙන් ආදායම් රැස්කර තිබුණි.

(ii) ආදායම් සංකේත 10.03.07.06 දරන ආදායම් ගිණුම අනුව 2013 වර්ෂයේ රැස්කළ ආදායම රු.10,838,496 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එකී ආදායම රු.4,504,500 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු.6,333,996 කින් හෙවත් සියයට 140 කින් වැඩි වී තිබුණි. 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ ආදායම වැඩිවිමට හේතුව 2012 සහ 2013 ඔක්තෝබර් මාසවල නිකුත් කරන ලද ගැසට් නිවේදන වලින් බලපත්‍ර ගාස්තු වැඩිකිරීම බව ආදායම් විචලායයට හේතු වශයෙන් දක්වා තිබුණද, ආදායම් මූලාශ්‍ර 4 ක් සඳහා වූ රු.1,639,600 ක ආදායම වැඩිවීම කෙරෙහි එකී ගැසට් නිවේදන මඟින් බලපෑමක් සිදු කර නොතිබුණි. ඒ අනුව ආදායම් වැඩිවීම සඳහා ආදායම් ගිණුමේ දක්වා තිබු හේතු පිළිගැනිමට නොහැකි විය.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**
**--------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 29001 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,477,327 ක් විය.

(ii) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 වගන්තිය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර නිලධාරියෙකු ස්ථාන මාරු වී ලබා ගිය දින සිට මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ සැසඳුම් ප්‍රකාශනවල නොපෙන්විය යුතු වුවත්, දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.268,850 ක ණය ශේෂ නිරවුල් කිරීමට මාස 05ක් හා මාස 06ක් දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.

(iii) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.1 හා 4.2 වගන්ති ප්‍රකාරව විශ්‍රාම යාමට නියමිත නිලධාරියා විශ්‍රාම යාමට ප්‍රථම ණය මුදල ආපසු අය කර ගැනීමට ඉඩ සලසනු පිණිස නිලධාරියාගේ කැමැත්ත පරිදි නියමිත වාරික ගණනට වඩා අඩු වාරික ගණනකින් ණය මුදල අය කර ගැනීම හෝ නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට අයවිය යුතු සියළු ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකිරීම නිසා විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.46,669 ක ණය ශේෂ නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි.

(iv) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4.1 සහ 4.5 වගන්තිවලට අනුව රජයට අය විය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් අය කර ගත නොහැකි අවස්ථාවලදී ඔහු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු යැයි නියම කොට ඇති ක්‍රියාමාර්ග ඇපකරු සම්බන්ධයෙන් ද අනුගමනය කර ණය මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, සේවය හැර ගිය නිලධාරින් 10 දෙනෙකුට අදාල රු.396,852 ක ණය ශේෂ අය කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(v) වැඩ තහනම් කළ නිලධාරීන් 06 දෙනෙකුගේ හිඟහිටි රු.654,410 ක ණය ශේෂයෙන් කිසිදු වාරිකයක් සමාලෝචිත වර්ෂයේදී අය කර නොතිබූ අතර එම නිලධාරීන්ගේ වත්මන් සේවා තත්ත්වය පිළිබඳ සොයා බලා ණය ශේෂ අය කර ගැනීමට පියවරද ගෙන නොතිබුණි.

(vi) දෙපාර්තමේන්තු සේවයේ නියුතු නොවන නිලධාරීන්ගේ හිඟහිටි ණය ශේෂ එකතුව රු.2,477,327 කින් සියයට 23 ක් හෙවත් රු.567,997 ක ණය ශේෂ වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිරවුල් නොකර පැවැත එන බව ණයගැති කාල විශ්ලේෂණය අනුව තහවුරු විය.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මකව නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණය අනුව පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**---------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර 2014 මාර්තු 15 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් ධීවර කාර්යාලවල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 මැයි 12 න් පසු අවස්ථා කිහිපයකදි විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ii) කර්මාන්ත අංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛන නිසි පරිදි පවත්වා නොතිබූ අතර විගණනයට ඉදිරිපත් කර තිබූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවද සම්පූර්ණ කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම භාණ්ඩ ලද වහාම බඩු ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු වුවද, බඩු ලේඛන පොතෙහි ඇතුළත් නොකරන ලද අයිතම 698 ක් අතිරික්ත භාණ්ඩ ලෙස භාණ්ඩ සමීක්ෂණයේදි හඳුනාගෙන තිබුණි.

(iv) සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව වූ අතිරික්තතා හා ඌනතා පිළිබඳව මුදල් රෙගුලාසි 757(2) අනුව කටයුතු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**---------------------------------------------**

සී/ස සීනෝර් පදනමට 2010 ජූනි 22 දින සිට තාවකාලික පදනමක් මත ලබා දී තිබූ ඩබල් කැබ් රථයක් සහ 2013 ජූලි 10 දින සිට මාස 02 ක කාලයක් සඳහා ලබා දී තිබූ වෑන් රථයක් දෙපාර්තමේන්තුව වෙත ආපසු ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**------------------------------------------------------------**

ආහාර හා කෘෂිකාර්මික සංවිධානය විසින් 2006 වර්ෂයේ දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ කැබ් රථයක් දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.6 අනුකූල නොවීම්

**-------------------**

**(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**----------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|

| | රු. | |
|---|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 94(1) | 4,160,142 | සමාලෝචිත වර්ෂයේදි වැය විෂයයන් 13 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. . |
| (ආ) මුදල් රෙගුලාසි 371(අ) | 103,500 | අවස්ථා 08 කදී ලබා දී තිබු ඉන්ධන අත්තිකාරම් දින 16 සිට දින 33 දක්වා කාලයක් ප්‍රමාද කර අත්තිකාරම් පියවා තිබුණි. |

## 2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) දිවි නැගුම ධීවර පසු අස්වනු තාක්ෂණික ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය

මෙම ව්‍යාපෘතිය මගින් 2012 වර්ෂයේදී දිස්ත්‍රික්ක 15ක තාක්ෂණික පුහුණුව ලත් ප්‍රතිලාභීන් 2675 දෙනෙකුට රු.10,000 බැගින් ණය මුදල් ලබාදීම ආරම්භකර තිබු අතර ඒ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 26.75 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 ජූලි මාසය වන විටද ඉහත සඳහන් ප්‍රතිපාදනයෙන් රු. මිලියන 13 කට ආසන්න මුදලක් නිකුත් කර නොතිබු අතර මුදල් ලබා දී වසරක් ගතවීමෙන් පසුද ණය ලබාදීමේ ප්‍රගතිය සියයට 45 ක් පමණ වි තිබුණි. එමෙන්ම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 10 ක් ආපසු යවා තිබුණි.

(ii) ණය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදලක් ලෙස ක්‍රියාත්මක කර තිබූ අතර 2013 දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිලාභීන් 1842 කට රු.18,420,000 ක ණය ප්‍රදානය කර තිබු අතර, එය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 71 ක් වී තිබුණි.

(iii) ණය ප්‍රතිලාභින් 535 ක් හෙවත් ප්‍රතිලාභින්ගෙන් සියයට 30 ක් පමණ එකතුව රු.1,334,935 ක ණය මුදල් ගෙවීම පැහැර හැර හෝ ප්‍රමාද කර හෝ තිබූ අතර ණය වාරික අය කර ගැනිම සම්බන්ධයෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය මට්ටමේ නිලධාරින්ගේ සහභාගීත්වය ඉතා දුර්වල මට්ටමක පැවැතුණි.

**(ආ) දිස්ත්‍රික් සමූපකාර සමිති චක්‍රීය ණය අරමුදල් ව්‍යාපෘතිය**

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ත්‍රිකුණාමලය හා පුත්තලම දිස්ත්‍රික්කවල මෙම ණය ව්‍යාපෘතිය චක්‍රීය ණය සැපයුම් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් සමූපකාර සමිති සංගමයකට තම සාමාජික ධීවර සමූපකාර සමිතියකට එක් වරකට නිකුත් කළ හැකි උපරිම ණය මුදල රු.100,000 ක් වුවත්, දිස්ත්‍රික් සමූපකාර සමිති 4 ක් විසින් සාමාජික සමූපකාර සමිති 12 ක් සඳහා රු.150,000 සිට රු.1,370,000 දක්වා ණය මුදල් නිකුත් කර තිබුණි.

(iii) සාමාජික සමූපකාර සමිති සංගමයක් විසින් ණය ආපසු ගෙවීමේ උපරිම කාලය අවුරුද්දක් විය යුතු වුවද, සාමාජික සමූපකාර සමිති 8 ක් විසින් ලබාගත් එකතුව රු.611,678 ක්වූ ණය මුදල් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ආපසු ගෙවා නොතිබුණි. ණය ලබාගත් කාලය අවුරුදු 1 සිට 3 දක්වා පරාසයක් වී තිබුණි.

(iv) සාමාජික ධීවර සමූපකාර සමිති විසින් දිස්ත්‍රික්ක සමූපකාර සමිති වෙත ණය මුදල් නිකුත් කිරිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරිම දුර්වල මට්ටමක පැවතුණි.

## 2.8 කාර්යසාධනය

----------------

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර ඉන් අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ක්‍රියාකාරි සැලැස්ම අනුව 290-01-01- 2401 දරන වැය විෂය යටතේ ධීවර අංශය දැනුවත් කිරීමේ වැඩසටහන් සැලැසුම් කර රුපියල් මිලියන 4.5 ක ප්‍රතිපාදනය ලබාගෙන තිබුණි. ප්‍රතිපාදන ඉතිරිකර ගැනිම සඳහා එම වැඩසටහන් සීමා කර වාහන අලුත්වැඩියාව සඳහා රුපියල් මිලියන 2 ක් මුදල් රෙගුලාසි 66 මගින් මාරුකර තිබූ අතර අදාළ වැය විෂය යටතේ වියදම රුපියල් මිලියන 2.5 ක් වී තිබුණි.

(ii) දෙපාර්තමේන්තු මූල්‍ය හා භෞතික කාර්යසාධන වාර්තාව අනුව ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුළත් වැඩසටහන් 19 ක අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟාවීමේ භෞතික කාර්යසාධනය සියයට 15 සිට සියයට 75 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබූ අතර වැඩසටහන් 04 ක අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟාවීමේ මූල්‍ය කාර්යසාධනය සියයට 16 සිට සියයට 60 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්ම දෙපාර්තමේන්තුවේ අයවැය ප්‍රතිපාදනයන්ට සරිලන පරිදි පිළියෙල කර තිබුණද, එකී ක්‍රියාකාරි සැලැසුම ප්‍රකාරව කාර්ය මෙහෙයුම් සිදුකර නොතිබීම හේතුවෙන් මූලධන වැය විෂයයන් 6 කට අදාළව සියයට 14 සිට සියයට 95 දක්වා ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් මාරු කර ගැනිමට සිදුවී තිබුණි. ඒ අනුව ක්‍රියාකාරි සැලසුම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරිම දුර්වල මට්ටමක විය.

(ii) පහත සඳහන් අවස්ථා වලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකර තිබුණු බව නිරීක්ෂණය විය.

- නායකයන් සඳහා නිපුණතා සහතිකයක් හඳුන්වාදීම (Introduced competency certificate for skippers) වැඩසටහන යටතේ සහතික පත් 1,000 ක් නිකුත් කිරිම සඳහා 290-01-01- 2502 වැය විෂය යටතේ රු.මිලියන 2.5 ක ප්‍රතිපාදන සළසා තිබුණද අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

- කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරිමේ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 8 ක් ප්‍රතිපාදනය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අදාළ කාර්ය ඉටුකර ගැනීමට අසමත්ව තිබූ අතර රු. 2,759,864 ක් වැය කර කාර්යයෙන් කොටසක් පමණක් ඉටුකර තිබුණි.

(iii) ධීවර නිලධාරීන් සඳහා ධාරිතාව නැංවීම - විදේශ (Training Capacity building for Fisheries Officers – foreign) වැඩසටහන යටතේ නිලධාරීන් 38 ක් විදේශ පුහුණුවීම් සඳහා යොමුකර තිබුණද, අදාළ පුහුණුවීම් සැලැසුම්කර හෝ එම වැඩසටහන් ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් කර හෝ නොතිබුණි. මේ සඳහා 290-01-01- 1102 දරන වැය විෂය යටතේ රු.මිලියන 2.8 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, රු. මිලියන 4.266 ක් වැයකර තිබුණි.

## 2.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබූ සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කීපයක් පහත දැක්වේ.

### (අ) මුහුදු කූඩැල්ලන් හා හක්බෙල්ලන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන පනතේ විධිවිධානවලට අනුව මුහුදු කූඩැල්ලන් හා හක්බෙල්ලන් ඇල්ලීම, එකතු කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය හා අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලතල ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරී තිබුණත්, 2011 ඔක්තෝබර් මාසයේ සිට මුහුදු කූඩැල්ලන් හා හක්බෙල්ලන් ඇල්ලීමේ සිට අපනයනය දක්වා කාර්යයන් ඉටු කිරීම සඳහා ලංකා ධීවර සංස්ථාව පෞද්ගලික ආයතන සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි. කිසිදු නීත්‍යානුකූල අයිතිවාසිකමක් නොමැතිව ලංකා ධීවර සංස්ථාව විසින් සිදු කර තිබුණු උක්ත කාර්යය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කිලෝ ග්‍රෑම් 01 කට රු. 10 බැගින් මුහුදු කූඩැල්ලන් අපනයනය කිරීම සඳහා පමණක් අය කර මත්ස්‍ය අපනයනකරුවන්ට බලපත්‍ර නිකුත් කර තිබුණි. එසේ බලපත්‍ර නිකුත් කර තිබියදී ධීවර සංස්ථාව විසින්ද එකී අපනයන සමාගම් සමඟ ගිවිසුම්වලට එළඹ ඇති අතර ගිවිසුම් කාලය මාස 03 ක් සඳහා එක් සමාගමකින් මසකට රු.500,000 ක් බැගින් අය කර තිබුණි. මෙය අමාත්‍යාංශ තීරණයක් මත අපනයනය කරනු ලබන හක්බෙල්ලන් හා මුහුදු කූඩැල්ලන් කිලෝ ග්‍රෑම් 01 කට රු.100 බැගින් අය කිරීමට කටයුතු කර තිබුණි. ඉතා සහනදායී ගාස්තු ක්‍රමයක් මත මත්ස්‍ය සම්පත කළමනාකරණය සඳහා අමාත්‍යාංශය විසින් නීති රීති සකස් කර තිබියදී ලංකා ධීවර සංස්ථාව විසින් මෙලෙස ගිවිසුම්වලට එළඹීම හා අධික මුදලක් අය කර ගැනීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් කිසිදු විමසීමක් සිදු කර නොතිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්තය |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 25 | 31 | - |
| (ii) | තෘතියික මට්ටම | 16 | 08 | 08 | - |
| (iii) | ද්විතියික මට්ටම | 608 | 460 | 148 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 107 | 89 | 18 | - |
| (v) | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අන්තර්ග්‍රහණය කරන ලද * | 42 | 40 | - | - |
| (vi) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | එකතුව | 829 | 623 | 205 | 01 |

* අංක අමප/11/2000/532/031 හා 2012 ඔක්තෝබර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත අන්තර්ග්‍රහණය කරන ලද වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත්ව සිටි වෙරළ ආරක්ෂක සැරයන් 04 දෙනෙකු සහ ආරක්ෂක නියාමකයින් 38 දෙනෙකු ඔවුන්ට පමණක් සීමා වන පරිදි බඳවා ගැනීමකි.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 205 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.